# සත්වයා හෝ සත්ව යැයි පැනවීම් හටගන්නා අයුරු

## සමිද්ධිසත්තපඤ්හ සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, සංයුක්ත නිකාය 4 - පිටු අංක 86 - 89)

යම් තැනක ඇස ඇත් ද, රූප ඇත් ද, චක්ඛු විඤ්ඤාණය ඇත් ද, චක්ඛු විඤ්ඤාණයෙන් දත යුතු ධර්මයන් ඇත් ද, එහි සත්වයා හෝ සත්ව යැයි පැනවීම් (සම්මුති) ඇත.

යම් තැනක කන ඇත් ද, ශබ්ද ඇත් ද, සෝත විඤ්ඤාණය ඇත් ද, සෝත විඤ්ඤාණයෙන් දත යුතු ධර්මයන් ඇත් ද, එහි සත්වයා හෝ සත්ව යැයි පැනවීම් ඇත.

යම් තැනක නාසය ඇත් ද, ගන්ධ ඇත් ද, ඝාණ විඤ්ඤාණය ඇත් ද, ඝාණ විඤ්ඤාණයෙන් දත යුතු ධර්මයන් ඇත් ද, එහි සත්වයා හෝ සත්ව යැයි පැනවීම් ඇත.

යම් තැනක දිව ඇත් ද, රස ඇත් ද, ජිව්හා විඤ්ඤාණය ඇත් ද, ජිව්හා විඤ්ඤාණයෙන් දත යුතු ධර්මයන් ඇත් ද, එහි සත්වයා හෝ සත්ව යැයි පැනවීම් ඇත.

යම් තැනක කය ඇත් ද, පහස ඇත් ද, කාය විඤ්ඤාණය ඇත් ද, කාය විඤ්ඤාණයෙන් දත යුතු ධර්මයන් ඇත් ද, එහි සත්වයා හෝ සත්ව යැයි පැනවීම් ඇත.

යම් තැනක මනස ඇත් ද, දහම් ඇත් ද, මනෝ විඤ්ඤාණය ඇත් ද, මනෝ විඤ්ඤාණයෙන් දත යුතු ධර්මයන් ඇත් ද, එහි සත්වයා හෝ සත්ව යැයි පැනවීම් ඇත.

යම් තැනක ඇස නැත් ද, රූප නැත් ද, චක්ඛු විඥානය නැත් ද, චක්ඛු විඥානයෙන් දත යුතු ධර්මයන් නැත් ද, එහි සත්වයා හෝ සත්ව යැයි පැනවීම් නැත.

යම් තැනක කන නැත් ද, ශබ්ද නැත් ද, සෝත විඥානය නැත් ද, සෝත විඥානයෙන් දත යුතු ධර්මයන් නැත් ද, එහි සත්වයා හෝ සත්ව යැයි පැනවීම් නැත.

යම් තැනක නාසය නැත් ද, ගන්ධ නැත් ද, ඝාණ විඥානය නැත් ද, ඝාණ විඥානයෙන් දත යුතු ධර්මයන් නැත් ද, එහි සත්වයා හෝ සත්ව යැයි පැනවීම් නැත.

යම් තැනක දිව නැත් ද, රස නැත් ද, ජිව්හා විඥානය නැත් ද, ජිව්හා විඥානයෙන් දත යුතු ධර්මයන් නැත් ද, එහි සත්වයා හෝ සත්ව යැයි පැනවීම් නැත.

යම් තැනක කය නැත් ද, පහස නැත් ද, කාය විඥානය නැත් ද, කාය විඥානයෙන් දත යුතු ධර්මයන් නැත් ද, එහි සත්වයා හෝ සත්ව යැයි පැනවීම් නැත.

යම් තැනක මනස නැත් ද, දහම් නැත් ද, මනෝ විඥානය නැත් ද, මනෝ විඥානයෙන් දත යුතු ධර්මයන් නැත් ද, එහි සත්වයා හෝ සත්ව යැයි පැනවීම් නැත.